(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 97.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2021 ඔක්තෝබර් 05 අඟහරුවාදා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

257/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති ක්‍රීඩා සංගම් අතරින් පසුගිය වසර 03 තුළ නිවැරදිව විගණන වාර්තා ඉදිරිපත්කර ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව හා ඒවායේ නම්;

(ii) එම සංගම්වල මූල්‍ය පාලනය විධිමත් කිරීමට අමාත්‍යාංශය විසින් ගනුලබන පියවර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

283/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මානව පරිභෝජනයට සුදුසු අල වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම අල වර්ගවල ඇති පෝෂණ තත්ත්වය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම ආයතනයේ නම කවරේද;

(iv) එම අල වර්ග අතර ඇති ඒක දේශික අල වර්ග සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දේශීය අල වර්ගවල පෝෂණ හා ඖෂධීය ගුණය ඉහළ බවත්;

(ii) වන විනාශය හා රසායනික පොහොර භාවිතය හේතුවෙන් එම අල වර්ග දුර්ලභ වී ඇති බවත්;

(iii) ඒ අතරින් ඇතැම් අල වර්ග මේ වනවිට වඳ වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) දේශීය අල වර්ග ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) දේශීය අල වර්ග අපනයනය කිරීමට හා ඒ ආශ්‍රිත නිෂ්පාදන දියුණු කිරීමට සැලසුම් සකස් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

512/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික පාසල් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා අමාත්‍යාංශය විසින් සැලසුමක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා පාසල් තෝරා ගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ජාතික පාසල් පද්ධතිය විධිමත් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

616/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි සිට 2019 නොවැම්බර් දක්වා ආරක්ෂක මණ්ඩල රැස්වීම පවත්වා ඇති දින සංඛ්‍යාව කවරේද;

(ii) එම රැස්වීම් සඳහා සහභාගිවූවන්ගේ නම් කවරේද;

(iii) ආරක්ෂක මණ්ඩල රැස්වීම සඳහා නීත්‍යානුකූලව සහභාගිවීමට හිමිකම ඇති දේශපාලනඥයන් සහ නිලධාරින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පැවති සම්ප්‍රදාය බිඳ හෙලමින් ඉහත කාලසීමාව තුළදී, විවිධ පුද්ගලයන් ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලට සහභාගී වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

764/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් අධ්‍යාපන පද්ධතිය ශක්තිමත් කළ හැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එකදු ජාතික පාසලක් හෝ නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iii) නව ජාතික පාසල් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iv) එම පාසල් ආරම්භ කිරීමේ පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

792/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ පදිංචි වී සිටින ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට මාතලේ දිස්ත්‍රික්කයේ වගාබිම්වල ආක්‍රමණික ශාක පැතිරෙමින් පවතින බව දන්නේද;

(iii) එම තත්ත්වය මාතලේ දිස්ත්‍රික්කයේ ගොවීන්ට හා ඔවුන්ගේ වගාබිම්වලට තර්ජනයක් බව දන්නේද;

(iv) මාතලේ දිස්ත්‍රික්කයේ වගාබිම්වල ආක්‍රමණික ශාක පැතිරීම වළක්වා ගොවි ජනතාව ආරක්ෂා කර ගැනීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

977/2020

ගරු වේලු කුමාර් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති නකල්ස් කඳු වැටියේ නකල්ස් වන රක්ෂිතය සීමාමායිම් සළකුණු කර ඇති උස මුහුදු මට්ටමේ සිට අඩිවලින් කොපමණද;

(ii) එම සීමාමායිම් සළකුණු කර ඇති ප්‍රදේශයට ඇතුළත් වී ඇති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නකල්ස් වන රක්ෂිතය ඇතුළත ජනපද තිබේද;

(ii) එම එක් එක් ජනපදයේ පදිංචි පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පවුල් සඳහා විකල්ප ඉඩම් ලබාදී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නකල්ස් වන රක්ෂිතය තුළ පෞද්ගලික ඉඩම් තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් වෙනුවෙන් විකල්ප ඉඩම් හෝ වන්දි හෝ ලබාදී තිබේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

989/2020

ගරු රෝහණ බංඩාර මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ පිහිටා ඇති මහජන පුස්තකාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පුස්තකාලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම තනතුරු සඳහා නුසුදුසු පුද්ගලයන් බඳවා ගෙන ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1202/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ලද උප තැපැල් ස්ථානාධිපතිවරුන් 1996 වර්ෂයේ සිට රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇති බවත්;

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව හා 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද නව බඳවාගැනීමේ පටිපාටිය අනුව මෙම පිරිස කළමනාකරණ සහකාර සේවයේ - II ශ්‍රේණියට බඳවාගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කළමනාකරණ සේවයේ සහකාර - II ශ්‍රේණියේ තනතුරුවල සේවය කරනු ලබන අනෙකුත් නිලධාරින්ට හා තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන අනෙකුත් නිලධාරින්ට ලබා දෙනු ලබන ප්‍රසූත නිවාඩු, වාර්ෂික නිවාඩු, අතිකාල දීමනා සහ කාර්යාල පහසුකම් ආදී වරප්‍රසාද ඉහත (අ) (ii) හි සඳහන් නිලධාරින්ට ලබා නොදීමට හේතු;

(ii) ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1863/2021

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැවිලි මානව සංවර්ධන භාරය විසින් වතු කම්කරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් ඉටුකරනු ලබන කාර්යභාරය කවරේද;

(ii) එම ආයතනය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාර්යාල පිහිටුවා ඇති ප්‍රදේශවල නම් කවරේද;

(iv) එම එක් එක් ප්‍රාදේශීය කාර්යාලයක් විසින් සේවා සපයනු ලබන වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා එම එක් එක් ප්‍රාදේශීය කාර්යාලයක් විසින් ක්‍රියාත්මක කරන ලද එක් එක් ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය වෙතින් ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා එක් එක් ප්‍රාදේශීය කාර්යාලය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය කාර්යාලක් විසින් සේවා සපයනු ලබන වතු කම්කරුවන් සංඛ්‍යාවට සාපේක්ෂව සාධාරණව බෙදී ගොස් ඇති බව සහතික කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— වරප්‍රසාද,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2021 සැප්තැම්බර් 07 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝග,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 75 වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 20 දිනැති අංක 2228/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.07.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝගය,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 75 වන වගන්තිය යටතේ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වන තොරතුරු තාක්‍ෂණය සහ සඵල සේවා නියම කරමින් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 ජූනි 29 දිනැති අංක 2234/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ නියෝගය,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 194 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් වන තොරතුරු තාක්‍ෂණය සහ සඵල සේවා නියම කරමින් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 ජූනි 29 දිනැති අංක 2234/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ නියෝග,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 194 වන වගන්තිය යටතේ පැවරුම් මිල නියෝග සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 මාර්තු 02 දිනැති අංක 2217/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 6(2) වන වගන්තිය යටතේ ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 මැයි 10 දිනැති අංක 2227/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ඛනිජතෙල් සම්පත් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

කම්කරු අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ නියෝගය,— 1958 අංක 15 දරන පනතේ 8 වගන්තිය සමඟ කියවිය යුතු 46 වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021.09.21 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

කර්මාන්ත අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ නියෝග,— 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 14(1)(ඊ) සහ 15 වගන්ති සමඟ කියවිය යුතු 53 වගන්තිය යටතේ මැණික් සහ ස්වර්ණාභරණ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් කර්මාන්ත සහ සැපයුම් කළමණාකරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 මාර්තු 02 දිනැති අංක 2165/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 53 වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 01 දිනැති අංක 2221/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ආගාමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

අධිකරණ අමාත්‍යතුමා,— සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ නියෝගය,— (101 අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 214 වගන්තිය සමඟ කියවිය යුතු 840 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජූලි 02 දිනැති අංක 2234/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2021 ජූලි 08) [1].

*15.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 06 දිනැති අංක 2226/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— 2015 ජනවාරි මස 08 වැනි දින සිට 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන් හි සහ පොලිස් සේවයෙහි සාමාජිකයින්ට සිදු වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම,—

උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2021.01.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමප/21/0105/301/003 හා 2021.02.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇත:—

(අ) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ආ) එම අවසන් වාර්තාවේ පළමුවැනි වෙළුමේ අයිතම අංක 08 හි සඳහන් දූෂණ විරෝධී කමිටුව සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම;

(ඇ) එකී අයිතම අංක 08 හි සඳහන් තීරණ අංක 1 සහ නිර්දේශ අංක 1 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා නිශ්චය කරනු ලබන වෙනත් සුදුසු යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම;

(ඈ) ඉහත කී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පළමුවැනි, දෙවැනි හා තෙවැනි වෙළුම්වල සහ එම අවසන් වාර්තාවේ යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨයේ අයිතම අංක 08 හි සහ අයිතම අංක 09 හි I සිට LXI දක්වා පැමිණිලිවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස එකී තීරණ හා නිර්දේශ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස්පති, අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත යොමු කිරීම; සහ

(ඉ) එකී අවසන් වාර්තාවේ තෙවැනි වෙළුමෙ හි අයිතම අංක 10 යටතේ සඳහන් පැමිණිලිවලට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ඊට අනුකූලව, ඉහත (ඇ) හි සඳහන් පරිදි අංක 2221/54 සහ 2021.04.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කර ඇති හෙයින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ඇතුළත් අයිතම අංක 08 හි තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ලැබීමෙන් පසු සලකා බලනු ලැබීමට යටත්ව එකී අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගන්නා ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ සහ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) අයිතම අංක 08 අත්හැර 09 සහ 10 අයිතමයන් හි ඇතුළත් තීරණ හා නිර්දේශ ඉහත (ඈ) සහ (ඉ) හි සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

17.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාහිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

816/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ පිහිටා ඇති ශික්ෂණ රෝහල්, දිසා රෝහල්, ප්‍රාදේශීය / මූලික රෝහල් සහ පර්යන්ත රෝහල්;

(ii) එම එක් එක් රෝහල මඟින් දෛනිකව ප්‍රතිකාර ගනු ලබන බාහිර රෝගීන්;

(iii) එක් එක් රෝහල් සඳහා අනුමත කාර්ය මණ්ඩල;

(iv) එක් එක් රෝහලේ මේ වනවිට පවතින සේවක පුරප්පාඩු;

සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත (අ) (iv) හි සඳහන් සේවක පුරප්පාඩු පුරවනු ලබන දින වකවානු කවරේද යන්න එතුමා දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත එක් එක් රෝහල සඳහා දෛනිකව ඇතුළත් කර ගනු ලබන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් රෝහලේ තිබෙන ඇඳන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඇඳන් සංඛ්‍යාව ප්‍රමාණවත්ද;

(iv) එම රෝහල්වල මේ වනවිට පවතින භෞතික සම්පත් හිඟයට විසඳුම් ලබා දෙනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2490/2021

ගරු කේ.සුජිත් සංජය පෙරේරා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යටියන්තොට ප්‍රදේශයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් නාගස්තැන්න වත්ත නමින් වත්තක් තිබෙන බවත්;

(ii) එම වත්තෙන් අක්කර 1000කට වැඩි ප්‍රමාණයක් පෞද්ගලික ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුට විකිණීමට හෝ බදු දීමට තීරණය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය කවරේද;

(ii) යටියන්තොට ප්‍රදේශයේ ජනතාවට සම්පතක් වන ඉහත සඳහන් වත්ත, ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේම තබා ගෙන සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?